## සම්පූර්ණ පඩි සහිතව එහෙත් එක දිගට අධ්‍යයන නිවාඩු නොලබා මෙරටදී රජයේ වියදමින් අධ්‍යයන කටයුතු/පාඨමාලා සඳහා සහභාගී වන නිලධාරීන් විසින් අත්සන් කළ යුතු ගිවිසුම.

(ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය නොමැතිව මෙම ආකෘතිය සංශෝධනය නොකළ යුතුය.)

---

(මෙහි මින්මතු ආණ්ඩුව යනුවෙන් සමහර තැනක සඳහන් කෙරෙන ) ලංකාණ්ඩුව එක් පක්ෂයකටද (මේ මින්මතු එකී අභ්‍යාසලාභියා යනුවෙන් සඳහන් කෙරෙන (1)........................................ තනතුරක නියුක්ත (2) ........................................ නැමැත්තා අනෙක් පක්ෂයට ද බැඳී එම දෙපක්ෂය විසින් වර්ෂ එක් දහස් නවසිය ................ වූ ................ මස ................ වැනි ද වන මෙදින ලියා අත්සන් කරනු ලබන ගිවිසුම් පත්‍රයයි.

(1) අදාළ ආයතනය හා නිලධාරියාගේ තනතුර

(2) අභ්‍යාසලාභියාගේ සම්පූර්ණ නම.

02. (මෙහි මින්මතු ප්‍රදාන ඒජන්සිය යනුවෙන් සමහර තැනක සඳහන් කෙරෙන ) (3) ........................................................................ විසින් එකී අභ්‍යාසලාභියාට අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාවක් හැදෑරීමට හැකි වනු පිණිස (මෙහි මින්මතු නියමිත කාල සීමාව යනුවෙන් සඳහන් කෙරෙන) (4) ........................................................................................ සිට ................................ දක්වා කාලයක් පවත්නා අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාවක් සඳහා තෝරා ගෙන ඇති හෙයින්ද,

(3) අධ්‍යයන කටයුතුවල නියැළෙන ආයතනයේ නම.

(4) නිවාඩු කාල සීමාව.

(03) එසේම එකී අභ්‍යාසලාභියාට එම අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාව හැදෑරීමට හැකිවන පරිදි මෙහි පහත දැක්වෙන වගන්තිවලට හා කොන්දේසිවලට අනුව ඔහු වෙනුවෙන් එකී අධ්‍යයන හා අභ්‍යාස ගාස්තුව වශයෙන් (5)........................................................ (3)........................ වෙත ගෙවීමට ලංකාණ්ඩුව එකඟ වී ඇති හෙයින්ද, (7)........................................................පැවැත්වෙන එම පාඨමාලාව සඳහා රාජකාරියට බාධා නොවන පරිදි සහභාගි වීමට අභ්‍යාසලාභියා එකඟ වී ඇති හෙයින්ද,

(05) මුදල් ප්‍රමාණය.

(07) සේවා කොන්දේසි ඇත්නම් ඒවා හා පුහුණුවල නියැළෙන දවස්.

(04) එසේම එකී වගන්තිවලට හා කොන්දේසිවලට අනුව එම පාඨමාලාව සඳහා සහභාගි වීමටත්, එම කාර්යය සඳහා (3)........................................යාමටත් එකී අභ්‍යාසලාභියා එකඟ වී ඇති හෙයින්ද,

දැන් මේ ලියා අත්සන් කරන ගිවිසුමේ වගහැටි මෙසේය:-

(1) ආණ්ඩුව නියම කළ විට එකී අභ්‍යාසලාභියා (3)........................................................ගොස් එහිදී ප්‍රදාන ඒජන්සිය සහ/හෝ (6) ........................................................ විසින් ඔහු වෙනුවෙන් පිළියෙල කොට ඇති අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාව නියමිත කාල සීමාව ඇතුලතදී අනලස්ව හැදෑරිය යුතුය.

(6) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ තනතුර

(2) එකී අභ්‍යාසලාභියා (03)................................................වෙත ගිය පසු එකී පරිපාලන ප්‍රධානයා වෙත ගොස් තමා පැමිණි බව වාර්තා කොට ස්වකීය කටයුතු සම්බන්ධයෙන් එකී ප්‍රදාන ඒජන්සිය සහ/හෝ (6) ........................................ විසින් නියම කරනු ලබන පුද්ගලයන්ගෙන් හෝ පුද්ගලයාගෙන් වරින් වර ලැබෙන සියළුම උපදෙස් පිළිපැදිය යුතුය.

(3) එකී අභ්‍යාසලාභියා (3) .............................. අධ්‍යාපනය කිරීමට බැඳී සිටින කාලය ඇතුළත ඔහු විසින් එකී අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාවකට/අදාළ විය හැකි කවර කාර්යයක් වුවද ඉටු කළ යුතුය. එසේම තමාගේ වැඩ කටයුතු පදිංචිය සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් (3)................ පරිපාලන නිලධාරියා වෙතින් ලැබෙන සියළුම උපදෙස් ද නොපිරිහෙලා විධිවූ පරිදි පිළිපැදිය යුතුය.

(4) එකී අභ්‍යාසලාභීන් විසින්................................ ගේ අනුමතිය කල් ඇති ලියවිල්ලක් ලබා නොගෙන, මෙහිලා සඳහන් කර ඇති සුදුසුකම් සහ/හෝ පුහුණුව හැර වෙනත් සුදුසුකම් සහ/හෝ පුහුණුවක් ලබා ගැනීමටත්, එබන්දක් ලබා ගැනීම සඳහා වෙනත් අධ්‍යයන හෝ අභ්‍යාස පාඨමාලාවක් හැදෑරීමටත් නියමිත කාල සීමාව ඇතුළත නොකළ යුතුය.

(5) ඉදින් පුහුණුව ලබන කාලය තුළ යම් අවස්ථාවකදී තමාට සළස්වා ඇති පහසුකම්වලින් එක එල්ලේ ලැබෙන ප්‍රතිඵලයක් වශයෙන් එකී අභ්‍යාසලාභියා යම් කිසි අලුත් කාර්යය ක්‍රමයක්, නව නිර්මාණයක් තනයක්, මූලධර්මයක්, තාක්ෂණයක්, ක්‍රමවේදයක්, ශිල්පීය ක්‍රියා පද්ධතියක් හෝ සූත්‍රයක් සොයා ගත හොත් හෝ ඒ පිළිබඳ අත්හද බැලීමක් කළහොත් හෝ ඔහු විසින් වහාම එම කාර්යය ක්‍රමය, ශිල්පීය ක්‍රියා පද්ධතිය, හෝ සූත්‍රය හෙළිදරව් කරමින් ඒ පිළිබඳ සියළුම විස්තර රෙජිස්ටර තැපෑලෙන් (6) .............................. වෙත එවිය යුතුය. එසේම.............................................. විසින් ආවරණය කරනු ලබන තුරුම ඔහු විසින් එම කරුණු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගත යුතුයි.

(6) එකී අභ්‍යාසලාභියා විසින් එකී අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාවේ කාල සීමාව ඇතුළත කරනු ලබන වැඩක් හෝ ඉටු කරනු ලබන සේවාවක් හෝ වෙනුවෙන් ස්වකීය අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාව භාරව සිටින බලධාරීන්ගෙන් කිසිම ගාස්තුවක් හෝ මුදලක් ඉල්ලා සිටීමටත්, භාර ගැනීමටත් නොකළ යුතුය. ඉහත කී පරිදි එබඳු යම් කිසි ගාස්තුවක් හෝ මුදලක් හෝ ඔහුට යම් අවස්ථාවකදී ගෙවනු ලැබුවහොත් (6).............................. නියම කරන ආකාරයට ඔහු විසින් එම මුදල් රජයේ ආදායමට බැර කළ යුතුය.

(7) එකී අභ්‍යාසලාභියා විසින් තමා (3).................................... අධ්‍යයනය කරන කාලය තුළ ස්වකීය අධ්‍යයනය කරන කාලය තුළ ස්වකීය අධ්‍යයන හා අභ්‍යාස පිළිබඳ වාර වාර්තා ප්‍රදායක ඒජන්සියේ පරිපාලන ප්‍රධානයා ලවා සහතික කරවා ගෙන (6) .................................... වෙත එවිය යුතුය.

(8) එසේම ඉදින්,

(අ) එකී අභ්‍යාසලාභියාගේ වැඩ/අධ්‍යයන කාර්යයන් සහ/ හෝ හැසිරීම සතුටුදායක නොවුවහොත්,

(ආ) රෝගාතුර වීම හෝ සෞඛ්‍යයෙන් පිරිහීම නිසා තවදුරටත් ලබන්නට එකී අභ්‍යාසලාභියා අයෝග්‍ය වුවහොත් හෝ නුසුදුසු වුවහොත්,

(ඇ) එකී අභ්‍යාසලාභියා මෙහිලා නියම කර ඇති වගන්ති හා කොන්දේසි නොපිළි පැද්දෙත්,

(ඈ) එකී අභ්‍යාසලාභියා තමන් ලබන අධ්‍යයනය සම්බන්ධයෙන් (6)............................... වෙත වාර වාර්තා එවීම පැහැර හැරියොත්,

(ඉ) නියිකලට එකී අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාව සම්පූර්ණ නොකළහොත්,

(ඊ) එකී අභ්‍යාසලාභියා (3)............................... නීතිරීති රෙගුලාසි, ස්ථාවර නියෝග, චක්‍රලේඛ හෝ විවේචනය කළහොත් හෝ උල්ලංඝණය කළහොත් ඒ පිළිබඳ අයෝග්‍ය ප්‍රකාශයක් කළහොත්, එවිට මෙම ගිවිසුම අවලංගු කර කවර අවස්ථාවක වුවද එකී අභ්‍යාසලාභියා ආපසු කැඳවීමට (6)...............................නිදහස ඇත්තේය.

(9) (3) ............................................... එම අධ්‍යයනය හා පුහුණුව අවසන් කිරීමෙන් පසුවද, තමාට (6) ............................... වෙනත් නියමයක් නොලැබුණ හොත් එකී අභ්‍යාසලාභියා (8)............................... යටතේම රාජකාරී කළ යුතුය. එකී පාඨමාලාව හැදෑරීම සඳහා ලංකාණ්ඩුව විසින් වැය කළ (5) ............................... වෙනුවෙන් අනිවාර්යය සේවා කාලය වශයෙන් ආයතන සංග්‍රහය විසින් නියම කර ඇති අවුරුදු ....................... ට නොඅඩු කාලයක් ඒ නියම පරිදි එකී කාලය ගතවනතුරු (7) ............................... යටතේම සේවය කළ යුතුය. (8) දෙපාර්තමේන්තුවේ නම.

(10) (9)............................... පිළිබඳ එම අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාව හදරා අවසන් වූ පසු එකී අභ්‍යාසලාභියා විසින් තම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සාමාන්‍යයෙන් හා විශේෂයෙන් ප්‍රයෝජනවත් විය හැකි වන කරුණු සම්බන්ධයෙන් ලබා ගත් දැනුම/දැනුම සම්භාරය /දැනුම වෙහෙස තම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත ලබා දිය යුතු යැයි හෝ එම දැනුම/දැනුම් සම්භාරය/දැනුම් වෙයෙස මෙහෙයවමින් කිසියම් විශේෂිත කාර්යයක් කළ යුතු යැයි හෝ (6) ............................... විසින් ඉල්ලා සිටි අවස්ථාවකදී ඒ පිළිබඳව අනලස්ව හා ඒ සඳහා විශේෂ පාරිශ්‍රමික අපේක්ෂා විරහිතව එවැනි සේවාවන් ඉටු කිරීමට එකී අභ්‍යාසලාභියා බැඳී සිටින්නේය.

(11) ............................................... හි සිටියදී රෝගාතුර වීම හේතුකොට ගෙන තම පුහුණු කාලසීමාව අවසන් කරන ලෙස හෝ දීර්ඝ කරන ලෙස ඉල්ලමින් එකී අභ්‍යාසලාභියා විසින් (6) ............................... වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන්නේ නම් තමා රෝගාතුර වී සිටින ....................... බව සනාථ කරනු පිණිස ............................... විසින් අනුමත කරනු ලබන වෛද්‍ය නිලධාරියකුගෙන් ලබා ගත් සහතිකයක්ද ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

(12) කවර කරුණක් නිසා හෝ අභ්‍යාසලාභියාට එම පුහුණු කාලය දීර්ඝ කිරීමක් අනුමත කරනු ලැබුවහොත් එසේ දීර්ඝ කළ කාලසීමාව තුළදී ඔහු මේ ගිවිසුමේ දක්වෙන නියමයන්ට අනුව දිගටම පුහුණුව ලබා ගත යුතුය. තවද එම දීර්ඝ කාල සීමාව ද පුහුණුවන කාල සීමාවේ කොටසක් ලෙස මුලදීම ඇතුලත් කර තිබුණාක් සේ සලකා එම දීර්ඝ කාලසීමාව සම්බන්ධයෙන් ද මෙම ගිවිසුමේ විධිවිධාන සර්වප්‍රකාරයෙන්ම අදාළ වනු ඇත.

ඉහත කී පරිදි එකී කාලය දීර්ඝ කර ගැනීමට අවසර දෙන ලද්දේ නම්, නැවත රාජකාරි භාර ගැනීමෙන් පසු මෙහි මුලින් දක්වා ඇති අවුරුදු () ...................... ක කාලසීමාවට අතිරේක වශයෙන් තවත් කාලසීමාවක් තුළ ආණ්ඩුවට සේවය කළ යුතු යයි නියම කරනු ලැබුවහොත් එම අතිරේක කාල සීමාව ගතවන තුරුද එකී අභ්‍යාසලාභියා ආණ්ඩුවට සේවය කිරීමට මෙයින් එකඟ වනු ලැබේ.

(13) (අ) ඉදින් එකී අභ්‍යාසලාභියා එම පාඨමාලාවේ කාලය ගත වී අවසන් වන්නට පෙර (6) ................................ කල්පනාවේ හැටියට සතුටුදායක නොවන යම් යම් හේතූන් නිසා ස්වකීය පාඨමාලාවෙන් අස්වුවහොත් හෝ තම ඉගෙනීම හා පුහුණුව අත්හැර දැමුවහොත්, මෙම ගිවිසුම යටතේ ලැබෙන සියළුම ඵල ප්‍රයෝජන ඔහුට අහිමිවූවා සේ සලකනු ලැබේ. එසේම ඔහු ඉල්ලා අස්වූ දිනය වන තෙක් එකී පාඨමාලාව සම්බන්ධයෙන් ආණ්ඩුව සහ ප්‍රදායක ඒජන්සිය විසින් ඔහු වෙනුවෙන් දරණ ලද වියදම්ද සම්පූර්ණයෙන්ම ආණ්ඩුවට ආපසු ගෙවීමට ඔහු යටත් වන්නේය.

(ආ) ඉදින් එකී අභ්‍යාසලාභියාට ප්‍රදානය කරන ලද එකී අභ්‍යාස පහසුකම් ඔහුගේ වැඩ සහ/හෝ හැසිරීම සතුටුදායක නොවීමේ හේතුවෙන් ප්‍රදායක ඒජන්සිය විසින් අවලංගු කරන්නට යෙදුනහොත් හෝ මෙකී 8(අ), (ඇ) හෝ (ඉ) යන වගන්ති යටතේ එකී අභ්‍යාසලාභියා ආපසු කැඳවනු ලැබුවහොත් හෝ එසේ කැඳවනු ලැබූ විටද තවදුරටත් පාඨමාලාව හැදෑරීම කරගෙන ගියහොත් හෝ තම අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාව අවසන්වූ පසු නැතහොත් නියමිත කාලයට කලින් එකී අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාව අවසන් කළ පසු නැවත පුරුදු පරිද්දෙන් (8)................................ සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ පාඨමාලාව අවසන් වූ හෝ අවසන් කළ දින සිට යටත් පිරිසෙයින් අවුරුදු ()............ ක් වත් ආණ්ඩුවට සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ ඉහත සඳහන් ප්‍රකාර එකී අවුරුදු () ...................... ක අනිවාර්යය සේවා කාල සීමාව ගත වන්නට පළමු ඔහු ආණ්ඩුව යටතේ ලබා ඇති පත්වීමෙන් ඉල්ලා අස්වුවහොත් හෝ එකී අවුරුදු.......... ක කාලසීමාව ගතවීමට පෙර ආකාර්යක්ෂමතාව නිසා නොහොත් වෙනත් කිසියම් හේතුවක් නිසා ඔහු සේවයෙන් පහ කරනු ලැබුවහොත් නැතහොත් ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ එකී අවුරුදු () ...................... ක කාලසීමාව ගතවීමට පෙර ඔහුගේ වයස අවුරුදු පැටවීමට කලින් විශ්‍රාම ගැනීමට මනාපය ප්‍රකාශ කළහොත් හෝ මෙම ගිවිසුමේ වෙනත් යම් කොන්දේසියක් පිළිපැදීමට ඔහු අපොහොසත් වුවහොත් හෝ එවිට මෙම පාඨමාලාව සඳහා එකී අභ්‍යාසලාභියා වෙනුවෙන් ආණ්ඩුවට සහ ප්‍රදායක ඒජන්සියට දැරීමට සිදු වූ වියදම් එකී අභ්‍යාසලාභියා විසින් ආණ්ඩුවට ආපසු ගෙවිය යුතු වන්නේය.

ඉහත කී පරිදි එකී කාලය දීර්ඝ කර ගැනීමට අවසර දෙන ලද්දේ නම්, නැවත රාජකාරි බාර ගැනීමෙන් පසු මෙහි මුලින් දක්වා ඇති අවුරුදු () ...................... ක කාලසීමාවට අතිරේක වශයෙන් තවත් කාලසීමාවක් තුළ ආණ්ඩුවට සේවය කළ යුතු යයි නියම කරනු ලැබුවහොත් එම අතිරේක කාල සීමාව ගතවන තුරුද එකී අභ්‍යාසලාභියා ආණ්ඩුවට සේවය කිරීමට මෙයින් එකඟ වනු ලැබේ.

(13) (අ) ඉදින් එකී අභ්‍යාසලාභියා එම පාඨමාලාවේ කාලය ගත වී අවසන් වන්නට පෙර (6) .............................. කල්පනාවේ හැටියට සතුටුදායක නොවන යම් යම් හේතුන් නිසා ස්වකීය පාඨමාලාවෙන් අස්වුවහොත් හෝ තම ඉගෙනීම හා පුහුණුව අත්හැර දමුවහොත්, මෙම ගිවිසුම යටතේ ලැබෙන සියළුම ඵල ප්‍රයෝජන ඔහුට අහිමිවූවා සේ සලකනු ලැබේ. එසේම ඔහු ඉල්ලා අස්වූ දිනය වන තෙක් එකී පාඨමාලාව සම්බන්ධයෙන් ආණ්ඩුව සහ ප්‍රදායක ඒජන්සිය විසින් ඔහු වෙනුවෙන් දරණ ලද වියදම්ද සම්පූර්ණයෙන්ම ආණ්ඩුවට ආපසු ගෙවීමට ඔහු යටත් වන්නේය.

(ආ) ඉදින් එකී අභ්‍යාසලාභියාට ප්‍රදානය කරන ලද එකී අභ්‍යාස පහසුකම් ඔහුගේවැඩ සහ/හෝ හැසිරීම සතුටුදායක නොවීමේ හේතුවෙන් ප්‍රදායක ඒජන්සිය විසින් අවලංගු කරන්නට යෙදුනහොත් හෝ මෙකී 8(අ), (ඇ) හෝ (ඉ) යන වගන්ති යටතේ එකී අභ්‍යාසලාභියා ආපසු කැඳවනු ලැබුවහොත් හෝ එසේ කැඳවනු ලැබූ විටද තවදුරටත් පාඨමාලාව හැදෑරීම කරගෙන ගියහොත් හෝ තම අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාව අවසන්වූ පසු නැතහොත් නියමිත කාලයට කලින් එකී අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාව අවසන් කළ පසු නැවත පුරුදු පරිද්දෙන් (8)................................ සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ පාඨමාලාව අවසන් වූ හෝ අවසන් කළ දින සිට යටත් පිරිසෙයින් අවුරුදු ()............. ක් වත් ආණ්ඩුවට සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ ඉහත සඳහන් ප්‍රකාර එකී අවුරුදු () ........................ ක අනිවාර්යය සේවා කාල සීමාව ගත වන්නට පළමු ඔහු ආණ්ඩුව යටතේ ලබා ඇති පත්වීමෙන් ඉල්ලා අස්වුවහොත් හෝ එකී අවුරුදු.......... ක කාලසීමාව ගතවීමට පෙර ආකාර්යක්ෂමතාව නිසා නොහොත් වෙනත් කිසියම් හේතුවක් නිසා ඔහු සේවයෙන් පහ කරනු ලැබුවහොත් නැතහොත් ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ එකී අවුරුදු () ...................... ක කාලසීමාව ගතවීමට පෙර ඔහුගේ වයස අවුරුදු හැටවීමට කලින් විශ්‍රාම ගැනීමට මනාපය ප්‍රකාශ කළහොත් හෝ මෙම ගිවිසුමේ වෙනත් යම් කොන්දේසියක් පිළිපැදීමට ඔහු අපොහොසත් වුවහොත් හෝ එවිට මෙම පාඨමාලාව සඳහා එකී අභ්‍යාසලාභියා වෙනුවෙන් ආණ්ඩුවට සහ ප්‍රදායක ඒජන්සියට දැරීමට සිදු වූ වියදම් එකී අභ්‍යාසලාභියා විසින් ආණ්ඩුවට ආපසු ගෙවිය යුතු වන්නේය.

(14) එකී අභ්‍යාසලාභියා ස්වකීය පාඨමාලාව අවසන් කර හෝ නියමිත කාලයට කලින් පාඨමාලාව නවත්වනු ලැබ ආපසු පැමිණිවිට හෝ ඉහත කී අවුරුදු ................ ක කාලයක් තුළ ඔහු සේවයේ නියුක්ත කරවා ගැනීමට ආණ්ඩුව බැඳී ඇති බවක්, මෙහි සඳහන් කිසිවකින් ව්‍යාංගික වෙතැයි නොසැළකිය යුතු අතර, කිසිවකින් එවැන්නක් අදහස් වෙතැයි ද තේරුම් නොගත යුතුය.

(15) ඉහත කී 12 වැනි සහ 13 වැනි වගන්ති යටතේ ආණ්ඩුවට අයවිය යුතු වූද ගෙවිය යුතු වූද මුදල් ප්‍රමාණය පිළිබඳ ගිණුම් ප්‍රකාශයකැයි සැලකෙන්නා වූද එකී (6) ................................ විසින් හෝ ඔහු වෙනුවට කෙනෙකු විසින් සහතික කරන ලදැයි සැලකෙන්නාවූද ලේඛනයක්, එහි අඩංගු කරුණු හෝ එහි තබා ඇති අත්සන් හෝ ඔප්පු කිරීම සඳහා අතිරේක හෝ වෙනත් සාධක නොමැතිව මුල් බැල්මට පිළිගැනන සාක්ෂ්‍යයක් වන බවටත් මෙයින් ගිවිසගනු ලැබේ.

(16) ඉහත කී 8 වැනි, 9 වැනි හා 13 වැනි වගන්තිවල සඳහන් කවර කරුණක් පිළිබඳව වුවද (9)........................................ විසින් හෝ ඔහු වෙනුවට කෙනෙකු විසින් අත්සන් කරන ලද සහතිකයක්, එහි අඩංගු කරුණු හෝ එහි තබා ඇති අත්සන් හෝ ඔප්පු කිරීම සඳහා අතිරේක හෝ වෙනත් සාධක නොමැතිව, මුල් බැල්මට පිළිගැනෙන සාක්ෂ්‍යයක් වන බවටත් මෙයින් ගිවිස ගනු ලැබේ.

(17) (6) ........................................................ යන පාඨයෙන් අදහස් කරන්නේ (6).................................. තනතුර උසුලන්නා වූ හෝ එම තනතුරෙහි වැඩ බලන්නා වූ හෝ දනට (6).............................විසින් කරනු ලබන කාර්යයන් එවකට ඉටු කරන්න වූ හෝ නිලධාරියාය.

(18) "වියදම්" යන පාඨමාලාව සඳහා දෙපාර්තමේන්තුවෙන් එකී ආයතනයට ගෙවන ලද සම්පූර්ණ මුදලද, අන්තිකාරම් හා දීමනා වශයෙන් අභ්‍යාසලාභියාට හෝ ඔහු වෙනුවෙන් හෝ යම් මුදලක් ගෙවන ලද්දේ නම් ඒ මුදල් ප්‍රමාණයන්ද ඇතුළත් වේ. "එමෙන්ම එකී වියදම් යන පාඨයට, පාඨමාලාව හදරන කාලය තුළ අභ්‍යාසලාභියා විසින් පාඨමාලාව සඳහා අවශ්‍ය වූ ප්‍රායෝගික කටයුතු සඳහා (10).......................... තම සේවා ආයතනයේ පරිහරණය කරන ලද උපකරණ , යන්ත්‍ර සූත්‍ර, ලිපි ද්‍රව්‍ය හා සම්බන්ධිත වෙනත් උපකරණ ........................ භාවිතා කිරීම සම්බන්ධයෙන් (6).................. විසින් යථා විවිධ සාධාරණ යැයි සලකා නියම කරන කිසියම් මුදලක් ද වෙතොත් එය ද ඇතුළත් වන්නේය.

(10) පරිහරණය කරන ලද දෙපාර්තමේන්තුවේ උපකරණ පිළිබඳ විස්තර.

මීට සාක්ෂ්‍ය වශයෙන් මේ ලියවිල්ලට සම්බන්ධ වන එකී දෙපක්ෂය විසින් වර්ෂ එක්දහස් නවසිය.................... වූ........................ මස.............. වැනිද වන මෙදින කොළඹ දී අත්සන් කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය සඳහා සහ
වෙනුවෙන් ක්‍රියා කරන,

පහත සඳහන් සාක්ෂ්‍යකරුවන් ඉදිරිපිටදී අත්සන් කළ බවට,

..................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(දෙපාර්තමේන්තු ප්‍රධානියා පුද්ගලිකව
අත්සන් කළ යුතුය.)

1. අත්සන :-
නම :-
ලිපිනය :-
තනතුර :- දෙපාර්තමේන්තුව :-
ජාතික හැඳුනුම්පත් අංකය :-

2. අත්සන :-
නම :-
ලිපිනය :-
තනතුර :- දෙපාර්තමේන්තුව :-
ජාතික හැඳුනුම්පත් අංකය :-

එකී අභ්‍යාසලාභියා පහත සඳහන් සාක්ෂ්‍යකරුවන් ඉදිරිපිටදී අත්සන් කළ බවට,

.........................................
අභ්‍යාසලාභියාගේ අත්සන

1. අත්සන :-
නම :-
තනතුර :- දෙපාර්තමේන්තුව :-
ලිපිනය :-

2. අත්සන :-
නම :-
තනතුර :- දෙපාර්තමේන්තුව :-
ලිපිනය :-